කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී සිව්වන වසර පරීක්ෂණය - පළමු සෙමෙස්තරය -2022/2023

PSC 4190 - ප්‍රජාතන්ත්‍රවාදය සහ ප්‍රජාතන්ත්‍රීකරණය

කාලය : පැ දෙකයි (02)

ප්‍රශ්න තුනකට **(03)** පමණක් පිළිතුරු සපයන්න.
එක් පිළිතුරකට ලැබෙන උපරිම ලකුණු ප්‍රමාණය විස්සකි (20).

---

1. අ) 'ප්‍රජාතන්ත්‍රවාදය' සහ 'ප්‍රජාතන්ත්‍රීකරණය' යන යෙදුම් නිර්වචනය කරන්න.

   ආ) නූතන ප්‍රජාතන්ත්‍රවාදය, ඇතීනියානු ප්‍රජාතන්ත්‍රවාදයට වඩා වෙනස් ලෙස සලකන්නේ ඇයි? පැහැදිලි කරන්න.

2. අ) නූතන ප්‍රජාතන්ත්‍රවාදය බිහි වූ සමාජ-ආර්ථික සහ දේශපාලන සන්දර්භය සාකච්ඡා කරන්න.

   ආ) "ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදය" යන සංකල්පය යුරෝපීයානු පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පයට වඩා වෙනස් වේ. මෙම වෙනස පැහැදිලි කරන්න.

3. ඇමරිකානු විද්වතුන් තම ප්‍රජාතන්ත්‍රවාදය තුන්වැදෑරුම් ආකාරයකට නිර්වචනය කර ඇත - එනම්, ජනතාවාදී, බහුත්වවාදී සහ ආයතනවාදී ලෙසය. මෙම තුන් වැදෑරුම් නිර්වචනයන් සාකච්ඡා කරන්න.

4. සැමුවෙල් හන්ටිංටන් ප්‍රජාතන්ත්‍රවාදයේ රැළි විස්තර කරමින් ඉදිරිපත් කරන ලද පළමු සහ දෙවන "ආපසු රැළි " ඇති වීමට බලපෑ සාධක මොනවාද? විචේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

5. අ) ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රීයකරණ ක්‍රියාවලිය සහ යුරෝපීය ප්‍රජාතන්ත්‍රීයකරණ අත්දැකීම් සසඳන්න.

   ආ) ශ්‍රී ලාංකිකයන් ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ඉතා ප්‍රබල සහයෝගයක් ලබා දෙන අතරම, ඒකාධිපති පාලකයන් ඉවසන්නේ මන්දැයි, සැමුවෙල් හන්ටිංටන්ගේ ප්‍රජාතන්ත්‍රවාදයේ රැළි පිළිබඳ තීසීසය ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

6. පහත තේමා අතරින් ඕනෑම දෙකක් **(02)** කෙටියෙන් සාකච්ඡා කරන්න.

   ආ) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය සහ එහි ගැටලු
   ආ) මධ්‍යම සහ නැගෙනහිර යුරෝපයේ ප්‍රජාතන්ත්‍රීකරණය සහ එහි ගැටලු
   ඇ) රැඩිකල් ප්‍රජාතන්ත්‍රවාදය
   ඇ) ක්‍රියාපටිපාටිමය ප්‍රජාතන්ත්‍රවාදය සහ හරයාත්මක ප්‍රජාතන්ත්‍රවාදය

***********